# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2130/18 - 2019 ජූලි මස 03 වැනි බදාදා - 2019.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන්දනා ගමන් ආඥාපනත

වන්දනා ගමන් ආඥාපනතට අනුව 2019 වර්ෂයේ ඇසළ පෙරහැර මංගල්‍ය පවත්වන දින වකවානු ගැසට් නිවේදනයකින් ප්‍රකාශයට පත් කිරීම (අම්මඩුව කුඩා කතරගම දේවාලය - වැලිගෙපොල)

2019 වසරේ ඇසළ පෙරහැර මංගල්‍ය සහ ජූලි මස 01 වන දින පිරිත් පිංකම සිදු කර කප් සිටුවීමේ සුභ මොහොතින් ආරම්භ කෙරේ.

* ජූලි මස 01 දින සර්වරාත්‍රික පිරිත් දේශනය
* ජූලි මස 02 දින දානය
* ජූලි මස 05 දින සිට 09 වන දින දක්වා උඩමළුවේ පෙරහැර ද
* ජූලි මස 10 දින සිට 14 වන දින දක්වා දෙවෙල පෙරහැර ද
* ජූලි මස 15 දින සිට 19 වන දින දක්වා මහා පෙරහැර ද
* ජූලි මස 20 දින සිට උදෑසන යෙදෙන සුභ මොහොතින් දිය කපා දහවල් පෙරහැර පැවැත්වීමද සිදුකෙරේ.

ii. දේවාලයේ උතුරට පිටුපස මුකලාන ද දකුණට රංවල අම්මඩුව පාරද නැගෙනහිරට දේවගිරි කපු මහතාගේ ඉඩම් ද බස්නාහිරට හීන් නිළමේ මහතාගේ ඉඩමද මායිම් වේ.

iii. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් ආහාරපාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී සහභාගි වීමට බලය නැත.

iv. දිසාපතිවරයාගේ ලිඛිත අවසර නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයෙක් හෝ වෙනත් යම් සතෙකු කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.

v. කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම තහනම්. එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සහ වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙන යාම ගොනුන් දක්කාගෙන යාම සම්බන්ධයෙන් මෙම නියෝග අදාල නොවන්නේ ය.

vi. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, කැවිලිහල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළෙඳ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 කට (ඝණ අඩි 4) නොඅඩු ධාරිතාවක් ඇති දැවමය හෝ ලෝහමය කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසළ බඳුන තැන්පත් කරන විට හෝ හැර සෑම අවස්ථාවකදීම, දැවමය හෝ ලෝහමය පියනකින් වසා තිබිය යුතු ය.

vii. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය කිරි අපද්‍රව්‍ය, හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි කොටස් හෝ පිසීමේ දී ඉවතලන ද්‍රව්‍ය හෝ වෙනත් ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක බිමට විසිකරනු නොලැබිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතිරි කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතු ය. එසේම ඉවතලන අපද්‍රව්‍ය, කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක බිමෙහි හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු ප්‍රධාන පදිංචිකරු හෝ ස්ථානය බලපත්‍රධාරියා විසින් එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපායන් යෙදූ බව සහ සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලැබේ.

viii. දිස්ත්‍රික් ලේකම්වරයාගේ මතයට අනුව මෙම නියෝගවල 15 වැනි 16 වැනි 17 වැනි 18 වැනි 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූ ද යම්' බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමට බලය ඇත.

ix. කඳවුරු පෙදෙස තුළ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්ම ද, යම් තැනැත්තෙකුට යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන විටෙකත් සෑම තැනැත්තෙක්ම ද, ඒ බව වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියකුට වහාම වාර්තා කළ යුතු ය.

x. ආසාදන රෝගයකින්, ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, හෝ භෝජනාගාරයක්, හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාරපාන හෝ බෙදා හැරීමේ දී, හෝ නිෂ්පාදනය කිරීමේ දී සහභාගි වීමට බලය ඇත.

xi. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක, හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දන්සැලේ, නවාතැන්පලේ හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතු ය. එවැනි ස්ථානයක ආසාදන රෝගියකු හෝ ස්පර්ශක රෝගියකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරියා විසින් හෝ ඒ බව වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වහාම වාර්තා කළ යුතු ය.

xii. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයකදී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීමට හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

xiii. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

xiv. දිස්ත්‍රික් ලේකම්, වෛද්‍ය නිලධාරියා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ පොලිස් නිලධාරියෙකු විසින්

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළු වීම ; සහ

(ආ) වැනි නියෝග යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් නාම ප්‍රදර්ශනය කර තැබීමෙන් කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

අනුරාධ ජයකොඩි,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
වැලිගෙපොල.

07 - 568

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.